සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 06 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 11 S |
|---|---|---|

## බුද්ධ ධර්මය

කාලය පැය දෙකයි

නම / විභාග අංකය :

**සැලකිය යුතුයි :- • සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01) සිදුහත් බෝසතාණන් වහන්සේට මනුලොව ඉපදීමට ආරාධනා කරන ලද්දේ,
i) සරීකාර බමුණා ය. ii) සහම්පති මහා බ්‍රහ්මයා ය.
iii) අසිත තවුසා ය. iv) සුද්ධෝදන රජතුමා ය.

02) පංච මහා විලෝකනයට අයත් නොවන්නේ,
i) කාලය. ii) දීපය . iii) මව. iv) පියා.

03) සිදුහත් කුමරුට නම් තැබීමේ උළෙල පැවැත්වූයේ කුමරු ඉපදී ,
i) දෙවන දිනයේ දී ය. ii) තුන් වන දිනයේ දී ය.
iii) හතරවන දිනයේ දී ය. iv) පස් වන දිනයේ දී ය.

04) බුදු දහමට අනුව මෙත් වැඩීමේ ආනිසංස ,
i) 11 කි. ii) 12 කි. iii) 13 කි. iv) 14 කි.

05) අත්ථස්සද්වාර ජාතකයේ දියුණුවීම සඳහා ඇති කරුණු හයෙහි " අලීනතා " යනු,
i) නිරෝගී බවයි. ii) දැහැමිව ජීවත් වීමයි.
iii) කම්මැලි නැතිකමයි iv) වැඩිහිටියන්ගේ උපදෙස් ලැබීමයි.

06) සීලය යනු,
i) කය හා වචනයේ සංවර බවයි. ii) සිත, කය හා වචනයේ සංවර බවයි.
iii) වචනයේ සංවර බවයි. iv) ති දොරේ සංවර බවයි.

07) ත්‍රි ශික්ෂාවට අයත් නොවන අංගය වන්නේ,
i) සීලය. ii) සමාධිය. iii) ප්‍රඥාව. iv) භාවනාව

08) " කායේන සංවරෝ සාධු " යන පාඨයෙන් අර්ථවත් වන්නේ ,
i) කය සංවර කර ගැනීම යහපත්ය. ii) වචනය සංවර කර ගැනීම යහපත්ය.
iii) මනස සංවර කර ගැනීම යහපත්ය. iv) තිදොර සංවර කර ගැනීම යහපත්ය.

09) සිගාලෝවාද සූත්‍රයට අනුව දෙමාපියන් නම් කර ඇති දිශාව වන්නේ,
i) දකුණු දිශාවටයි. ii) උතුරු දිශාවටයි. iii) නැගෙනහිර දිශාවටයි. iv) බටහිර දිශාවටයි.

10) සමාජයේ යුතුකම් පිළිබඳ ඇතුළත් සූත්‍ර දේශනාව වන්නේ,
i) මහා මංගල සූත්‍රයයි. ii) සිගාලෝවාද සූත්‍රයයි.
iii) රතන සූත්‍රයයි. iv) දම්සක් පැවතුම් සූත්‍රයයි.

**★ ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට සපයා ඇති පිළිතුර අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

11) මස මානවක ඇතුළු පිරිස ආරක්ෂා කළේ ........................................... ප්‍රතිපදාවයි.

12) බුදුරජාණන් වහන්සේ රාහුල හාමුදුරුවන්ට ...................................... සූත්‍රය දේශනා කළහ.

13) ලොව ඇති සියල්ල සෑම මොහොතක වෙනස් වන බව පැහැදිලි කරන බෞද්ධ
ඉගැන්වීම ....................................................... ලෙස හඳුන්වනු ලබයි.

14) මිහිඳු මහ රහතන් වහන්සේ දේවානම්පියතිස්ස රජුට මුලින්ම දේශනා කළේ ...................................... සූත්‍රයයි.

15) ශ්‍රී ලංකාවේ පැවිදි වූ මුල්ම කාන්තාව වූයේ ............................................ බිසවයි.
( අනුලා, චූල්ලහත්ථි පදෝපම සූත්‍රය, පංචශීල, අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය, මෛත්‍රී, අටසිල්, )



LIVEWORKSHEETS

★ **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්න වලට හරි නම් ( ✓ ) ලකුණ ද , වැරදි නම් ( X ) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.**

16) ලක්දිවට බුදු දහම ලැබීමෙන් අනතුරුව ඉදි වූ ප්‍රථම ස්තූපය වන්නේ රුවන්වැලි සෑයයි. (...........)

17) මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු පිරිස ලක්දිවට වැඩම කරන ලද්දේ පොසොන් පොහොය දිනකය. (...........)

18) සංඝමිත්තා තෙරණිය සමඟ ශිල්ප ශ්‍රේණි 18 ක පිරිසක් ලංකාවට පැමිණියහ. (...........)

19) දැඩි ලෝභය නිසා විනාශයට මෙන්ම පිරිහීමට ද හේතු වන බව කියැවෙන ජාතක කතාවක් ලෙස අත්ථස්සද්වාර ජාතකය ගත හැක. (...........)

20) ශ්‍රද්ධාව යනු තෙරුවන් කෙරෙහි ඇති වන පැහැදීමයි. (...........)



LIVEWORKSHEETS